2025 JANUARY

# CURRENT ISSUES

ADIC
Alcohol and Drug Information Centre

# හැඳින්වීම

මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC ආයතනය) වසර 30 කට වැඩි කාලයක් දුම්වැටි, මද්‍යසාර සහ අනෙකුත් මත්ද්‍රව්‍ය වලින් ජනතාව නිදහස් කර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටියි. එම වැඩසටහන් අතර දුම්වැටි මද්‍යසාර හා අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය ප්‍රවර්ධනය වීමට බලපාන සාධක නිරන්තරයෙන් සොයා බලා ඒ පිළිබඳව ජනතාව සහ අදාළ බලධාරින්ගේ අවධානයට යොමු කරමින් ඒවායේ බලය අඩු කිරීමටත් එම බලපෑම් නතර කිරීම සඳහාත් කටයුතු කරයි.

ඒ අනුව ආයතනයේ පුස්තකාල හා තොරතුරු අංශය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන පුවත්පත් වන සිළුමිණ, දිනමිණ, දිවයින, මව්බිම, ලංකාදීප, අද, අරුණ, මොණරා ආදී පුවත්පත් දිනපතා විශ්ලේෂණයක් සිදු කරයි. මීට අමතරව විද්‍යුත් මාධ්‍ය නාලිකා කිහිපයක්ද නිරීක්ෂණය කරයි. එහිදී පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරයි.

- මද්‍යසාර ප්‍රවර්ධනය කිරීම
- මද්‍යසාර භාවිතය අධෛර්යමත් කිරීම
- මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- මද්‍යසාර සම්බන්ධයෙන් වැටලීම් සිදුකිරීම

මෙම වාර්තාව තුළ ඉහත කරුණු පුවත්පත්වල වාර්තා වී ඇති ආකාරය කෙසේද යන්න සම්බන්ධව සඳහන් වී ඇත. මෙහි අරමුණ වන්නෙ පුවත්පත් තුළ දුම්වැටි, මද්‍යසාර සහ අනිකුත් මත්ද්‍රව්‍ය වලින් සිදුවන ප්‍රවර්ධනයන් අවම කිරීම සහ මත්ද්‍රව්‍ය නිවාරණය සම්බන්ධව සිදුවන ධනාත්මක පළ කිරීම් පිළිබඳව ජනතාව සහ අදාළ බලධාරීන් දැනුවත් කිරීමයි.

# PRINT MEDIA

## PROMOTIONS

ඇතැම් පුවත්පත් මත්ද්‍රව්‍ය නිවාරණය මුල් කොට ගෙන පළ කරනු ලබන පින්තූර තුළින් මෙය තව තවත් ප්‍රවර්ධනය වන බවත් ඒ තුළින් එය අත්හදා බැලීමට යොමු වන ප්‍රමාණය වැඩි වීමත් සිදුවේ.





2025.01.06

පැල්වත්තේ එතනෝල්වලින් අඩු මිලට හොඳ අරක්කු හදනවා

අරක්කු ලීටර් 250,000ක්

හොඳ අරක්කු අඩු මිලට දෙන බව පවසා රටේ ජනතාවගේ මද්‍යසාර භාවිතය වැඩි කරමින් මද්‍යසාර සමාගම් වලට ලාභ ගෙනදීමට කටයුතු කරන්නෙ ජනතා හිතැති පාලකයන්මද?

2025.01.07 - mawbima

# 'වේප්' ඉලෙක්ට්‍රොනික් දුම්වැටියට පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වහ වැටෙති

■ ජා-ඇළ - ප්‍රසංග පාවුළුහේවා

ජා-ඇළ ප්‍රදේශයේ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර 'වේප්' නමැති ඉලෙක්ට්‍රොනික මත් දුම්වැටිය ප්‍රචලිත වෙමින් තිබෙන බව ප්‍රදේශවාසීහු පෙන්වා දෙති. විවිධ රසයන්ගෙන් හා විවිධ සුවඳ සහිතව මෙම ඉලෙක්ට්‍රොනික දුම්වැටිය විකිණීමට ඇතිද බවද ඔවුහු සඳහන් කරති. 'වේප්' දුම්වැටිය පාසල් සිසු - සිසුවියන් අතර ප්‍රචලිත වෙමින් පැවැතීම සම්බන්ධයෙන් උපකාරක පන්ති ගුරුවරයකු වූ සිතුම් යුරාජ මහතා අප සමඟ මෙලෙස අදහස් දක්වා සිටියේය.



"වේප් කියන ඉලෙක්ට්‍රොනික දුම්වැටිය සිසුන් වගේම ශිෂ්‍යාවන් අතරත් ජනප්‍රිය වෙමින් පවතින්නේ. මෙය බැලූ බැල්මට දුම්වැටියක් කියලා හඳුනාගන්න අමාරුයි. පෑනක, හයිලයිටරයක, මකන කෑල්ලක ස්වරූපයෙන් මෙය තියෙනවා. බොහෝ විට මේවා සිසුන්ට අලෙවි කෙරෙන්නේ අන්තර්ජාලය හරහායි. අන්තර්ජාලයේ 'වේප්' දුම්වැටිය අලෙවිය හා භාවිත කරන ආකාරය පිළිබඳව තොරතුරු තියෙනවා. රුපියල් දෙතුන් දහසේ ඉඳලා දහපළොස්දස වැනි මිල ගණන්වලට මේවා තියෙනවා. මෙම තත්ත්වය තවදුරටත් පැතිරුණොත් ලොකු ගැටලුවක් ඇති වෙන්න පුළුවන්. පාසල් තුළ වගේම උපකාරක පන්තිවල ගුරුවරුන්ද මේ ගැන අවධානය යොමු කිරීම වැදගත්. අපි අපගේ උපකාර පන්තිවල හදිසියේ ළමයින්ගේ බෑග් චෙක් කරනවා. එතකොට ළමයින් කිහිපදෙනකුගේ හෝ බෑග්වල මේ දුම්වැටිය තියෙනවා. ශිෂ්‍යාවන් ගාවත් තිබිලා අපිට හමුවන අවස්ථා තිබෙනවා. අපි එවැනි අවස්ථාවලදී ළමයින්ට අවවාද කරලා මවුපියන් දැනුවත් කරනවා. මේවායේ නීතිමය තත්ත්වය පැහැදිලි නෑ. නමුත් මෙය සිසුන් විනාශ කරන ඇබ්බැහිවීමක් කියලා කියන්න පුළුවන්. පාසල් හෝ පෞද්ගලික පන්ති ගුරුවරුන්ට පමණක් පාලනය කළ හැකි දෙයක් නොවේ මේ. විශේෂයෙන් මවුපියන් තම දුව, පුතා ගැන අවධානයෙන් ඉන්න ඕනේ. සමහර කාර්යබහුල මවුපියන්ට ළමයි මඟහැරෙනවා. ඒ වගේම සමහර මවුපියන් ඉන්නවා තම දරුවා අතින් වැරැද්දක් වෙයි කියලා පිළිගන්න අකැමැතියි. මේ දෙකොටස තමයි ප්‍රධාන වශයෙන්ම මෙවැනි විනාශයන්ට ලක්වෙන්නේ. අපි කියන්නේ ළමයින්ගේ හැසිරීමේ චූටි වෙනසක් හරි තියෙනව නම් මවුපියන් විශේෂයෙන් ඔවුන් ගැන සොයලා බලන්න. අපිට ළමයින්ගේ ප්‍රශ්නවලට මැදිහත් විය හැකි ප්‍රමාණය සීමාසහිතයි. ඒ නිසා මවුපියන් තම ළමයි ගැන වැඩි අවධානයක් යොමු කිරීම තමයි ඉතාම වැදගත්."

# ඉංගිරියේ සිසුහු තිදෙනෙක් කසිප්පු බී වෙරිවෙලා - දෙදෙනෙක් රෝහලේ

■ බුලත්සිංහල ලක්මි කුඩලිගම සහ ඉංගිරියේ නිමාලි කහවල

**ඉංගිරියේ පාසල් දෙකක 16 හැවිරිදි සිසුන් පිරිසක් ඉංගිරිය වත්තේ කසිප්පු තිප්පොළකින් මත්වී ඉංගිරිය කටහය නාන තොටුපළ අසල මහ පාරේ නිදා සිටින බවට ලද තොරතුරක් අනුව ඊයේ (12) සවස අත්අඩංගුවට ගෙන මත් ගතිය වැඩි සිසුන් දෙදෙනකු රෝහල් ගත කිරීමට කටයුතු කළ බව ඉංගිරිය පොලිසිය පවසයි.**

ඉංගිරිය ඇලබඩ පාර කටහය නාන තොටුපොළ අසල සිසු පිරිසක් මත්පැන් පානය කර මත්වී මහ පාරේ බුදියන් සිටින බවට ඉංගිරිය පොලිසිය හදිසි ඇමතුම් අංශයට තොරතුරක් ලැබී තිබේ.

ඒ අනුව ගිය පොලිස් නිලධාරීන් පිරිසක් පානය කර ඉතිරි වූ කසිප්පු පැකට් පහක් සමඟ සිසුන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති අතර අත්අඩංගුවට ගත් සිසුන් තිදෙනාගෙන් දෙදෙනෙකු මත් ගතිය වැඩි නිසා ඉංගිරිය රෝහලට ඇතුළත් කර ඇතැයි පොලිසිය පවසයි.

අත්අඩංගුවට ගත් අනෙක් සිසුවාගෙන් කළ විමර්ශනයෙන් හෙළිව ඇත්තේ මෙම සිසුන් ඊයේ (12) උදෑසන ඉංගිරිය ප්‍රදේශයේ කාලයක් තිස්සේ කසිප්පු ජාවාරමේ යෙදී සිටින 'රෝද පුටුවා' නැමැති අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන තැනැත්තාගේ බිරියගෙන් කසිප්පු පැකට් කිපයක් මිලදීගෙන ඉංගිරිය ඇලබඩ පාර කටහය නාන තොටුපොළට ගොස් කසිප්පු පානය කළ බවත් නැමට සූදනම් වූ අවස්ථාවේ මිතුරන් දෙදෙනෙකුට කසිප්පු මත වැඩි වී මහ මාර්ගයේ නිද ගත් බවයි.

"රෝද පුටුවා" නැමැති අන්වර්ථ නාමයෙන් හඳුන්වනු ලබන තැනැත්තාගේ බිරිය අත්අඩංගුවට ගත් බවද පොලිසිය පැවසීය. රෝද පුටුවා නැමැති අය ආරක්ෂක අංශයක සේවය කර ආබාධිත වී දෙපා අහිමිව සිටින පුද්ගලයෙකු බවත් ඔහු රෝද පුටුවේ සිට කාලයක් තිස්සේ මෙම කසිප්පු ජාවාරමේ යෙදී සිටින අයෙක් බවට පොලිසියට තොරතුරු ලැබී ඇතැයි ද පොලිසිය පැවසීය.

මෙ පිළිබඳව ඉංගිරිය පොලිසිය පරීක්ෂණ පවත්වන අතර අත්අඩංගුවට සැකකාරිය හොරණ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමය නියමිතව සිටියාය

**ළමයින් යනු නිරන්තරයෙන් කුතුහලය පිටුපස ඇදෙන පිරිසකි. පාසල් ශිෂ්‍යයන් පිළිබඳව ඇතැම් පුවත් වාර්තාකරණය හරහා සිදු වන්නෙ සිසුන් මත්ද්‍රව්‍ය සඳහා පොලඹවා ගැනීමක් නොවේද?**

# PRINT MEDIA

## PREVENTION

### මත්පැන් නිසා වසරකට 20,000ක් මරුවට

### අදාළ මරණ නිසා දරුවන් විශාල පිරිසක් පීඩාවට

**– ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ මද්‍යසාර, දුම් කොළ, නීති විරෝධී මත්ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥ කමිටුව**

**නිදර්ශනී වික්‍රමසිංහ**

ශ්‍රී ලංකාවෙහි වර්ෂයකට මත්පැන් හේතුවෙන් පුද්ගලයන් 20,000ක් පමණ මිය යන බවත්, ඒ හේතුවෙන් දරුවන් විශාල පිරිසක් අසරණ වන බවත් ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ මද්‍යසාර, දුම් කොළ, නීති විරෝධී මත්ද්‍රව්‍ය පිළිබඳ විශේෂඥ කමිටුව පෙන්වා දෙයි.

එහි සභාපතිනි, මහාචාර්ය අනුලා විජේසුන්දර මහත්මිය ප්‍රකාශ කර සිටියේ කාන්තා පියයුරු පිළිකාවලට හේතුවන ප්‍රධානතම අවදානම් සාධකයක් ලෙස ඇල්කොහොල් හඳුනාගෙන ඇති බවයි.

ඒ අනුව සුරාබදු කොමසාරිස් වරයා කියූ අඩුමිල බෝතලයට ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය තරයේ විරුද්ධ බව මහාචාර්යවරිය අවධාරණය කළාය.

ඇය වැඩිදුරටත් මෙසේද පැවසුවාය.

"2023 ජනවාරි මසදී ලෝක සෞඛ්‍ය සංවිධානය කීවේ ඕනෑම මට්ටමක මද්‍යසාර සිරුරට හානිකර බවයි.

සුරාබදු කොමසාරිස් වරයා කියූ අඩුමිල බෝතලයට ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය තරයේ විරුද්ධ වනවා.

අරක්කු මිල අඩු කිරීමෙන් අරක්කු පරිභෝජනය වැඩි වනවා. කසිප්පු බොන අය එසේම බොනවා.කසිප්පුවල සිට අරක්කු වෙත හැරීමක් වන්නේ නෑ."මද්‍යසාර නිසා කායික මානසික රෝග වැඩි වනවා.මද්‍යසාර නිසා ලස්සන ජීවිතයක් පොහොසත් රටක් යන සංකල්පය විනාශ වී රට තවත් දිළිඳු වෙනවා"




The latest tax has yielded a profit windfall of Rs. 7 bn to tobacco companies.

Part of the profit will be utilised to oil some palms, methinks.

### දුම් බොන්නන් පසුපස මාරාන්තික රෝගයක්

ශ්‍රී ලංකාවේ වයස 40ට වැඩි අයගෙන් 10% ක් රෝගයට ගොදුරුවෙලා

| නිශාන්ත කුමාර බණ්ඩාර

පිටුව 02

**බෝ නොවන රෝග ඇතිවන ප්‍රධාන සාධක 4න් 2ක්ම දුම්වැටි සහ මද්‍යසාර භාවිතය නිසා ඇති වේ.**




**දුම්කොළ භාවිතය පිළිකා ඇතිවීම සඳහා සෘජුවම බලපාන නමුත් දුම්කොළ සමාගම් නීතිමය අවසර ඇතිව මිනී මරනවා.**

**සුරාබදු ආදායම ඉහළ නැංවීම තුළින් දුම්කොළ සහ මද්‍යසාර භාවිතා කරන පිරිස අඩු වන බව පැහැදිලි වේ.**

2025.01.15 - the morning

ALCOHOL/TOBACCO

## Consumption reduced, excise revenue hike: ADIC

The Alcohol and Drug Information Centre (ADIC) claimed that due to the 20% increase in alcohol taxes in 2023, alcohol (pure) consumption has decreased by 8.3 million litres, and that the Government's alcohol excise revenue has increased by Rs. 11.6 billion. The ADIC also claimed that the Government's excise revenue from cigarettes has increased by Rs. 7.7 billion in 2023, while cigarette sales have decreased by Rs. 521.5 million.

The ADIC made this claim while issuing a statement regarding the use of alcohol and cigarettes and the increase in taxes. Accordingly, the excise rates were increased this month.

"Alcohol use causes nearly 15,000 premature deaths in Sri Lanka each year, while smoking kills nearly 20,000 people annually. The number of deaths from non-communicable diseases (NCDs) in our country has now increased to 80%. Two of the four main factors affecting NCDs are smoking and alcohol use. Alcohol is a carcinogen and even small amounts of alcohol consumption increase a person's risk of cancer. Statistics show that the health and economic costs of alcohol and the amount of tax collected from alcohol have not been able to cover the economic and health-related costs of alcohol. According to a study conducted in 2022, the economic and health costs of alcohol are Rs. 237 billion while the alcohol-related tax revenue that year was Rs. 163.2 billion. The excise duty on the cigarette category with the highest sales in the market has increased by Rs. 4.31; however, its price has increased by Rs. 10. The additional profit that the cigarette industry will receive from this tax increase is approximately Rs. 7,000 million."

**තරුණයන් අතර ව්‍යාප්ත වන**

# දුම්කොළ නිෂ්පාදන භාවිතය නිසා පාසල් ළමයින් අනතුරේ

**ගාල්ල රෝහලේ විශේෂඥ මනෝ වෛද්‍ය රූමි රූබන්**



■ ගාල්ල - ෆර්හාන් නිසාම්දීන්

**මත්ද්‍රව්‍ය භාවිතයට ශිෂ්‍යයන් යොමු වීම වැළැක්වීම සඳහා ගන්නා උත්සාහය අගය කළ යුතුයි.**

# PRINT MEDIA

## LAW ENFORCEMENT

**නීතිය හදන්න ඉන්න මහත්වරුම නීති විරෝධී කටයුතු වල නිරත වුණාම කවුද නීතිය හදන්නේ?**



**බන්ධනාගාර නියාමකගේ තොප්පියෙන් අයිස් හමුවෙයි**

ෂේන් සෙනෙවිරත්න

පල්ලෙකැලේ දුම්බර බන්ධනාගාර රෝහලේ රාජකාරියේ නියුතු බන්ධනාගාර නියාමකවරයෙකුගේ හිස් වැසුම පරීක්ෂා කිරීමේදී, ඒ තුළ තිබී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05යි මිලිග්‍රෑම් 28ක් හමුව තිබේ.

දුම්බර බන්ධනාගාරයේ නියාමකවරයෙකු අයිස් මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන බවට ලද තොරතුරකට අනුව, බන්ධනාගාර බුද්ධි නිලධාරීන් කලක සිට අවධානයෙන් සිට තිබේ. ඒ අනුව පෙරේදා (19දා) අදාළ නියාමකවරයා පරීක්ෂා කිරීමේදී, ඔහුගේ හිස් වැසුමේ ඇතුල් පැත්තේ කිසිවෙකුටත් සැක නොසිතෙන ආකාරයට සියුම් කැපුමක් යොදා, ඒ තුළට මෙම අයිස් මත්ද්‍රව්‍ය ඇතුල් කොට තිබියදී බුද්ධි අංශ නිලධාරීන් විසින් සොයාගෙන තිබේ.

මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී බන්ධනාගාර රෝහලේ ප්‍රතිකාර ලබන රෝගීන්ට මෙම නියාමකවරයා මත්ද්‍රව්‍ය සපයා ඇති බවට බන්ධනාගාර නිලධාරීහු සැක පළකරති.

සැකපිට අත්අඩංගුවට ගත් නියාමකවරයා, පල්ලෙකැලේ පොලීසියට භාර දී ඇති අතර, ඔහු සම්බන්ධයෙන් බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විනය අංශය විසින්ද විමර්ශනයක් සිදුකරයි.



**සුපිරි එළවලා: පොලිස් රිය ත්‍රිරෝදයේ හප්පා පැන්න එස්.අයි රිමාන්ඩ්**



**ලක්ෂ 5ක අයිස් එක්ක එස්.අයි. දැලේ**



**දුම්බර බන්ධනාගාර නියාමකවරයෙක් අයිස් එක්ක කොටු**

■ තොප්පිය අස්සෙ තියාගෙන ඉඳලා

ජයන්ත සමරකෝන්

දුම්බර බන්ධනාගාරයේ නියාමකවරයකු අයිස් නැමැති මත්ද්‍රව්‍ය තොගයක් සිය හිස්වැස්මේ සූක්ෂ්ම ලෙස සඟවාගෙන රාජකාරි කරමින් සිටියදී අත්අඩංගුවට ගෙන ඇතැයි බන්ධනාගාර මාධ්‍ය ප්‍රකාශක ගාමිණී බී. දිසානායක පවසයි.

මෙහිදී අයිස් බවට සැකකරන මත්ද්‍රව්‍ය ග්‍රෑම් 5ක් හා මිලිග්‍රෑම් 28ක් සමඟ සැකකාර නියාමකවරයා අත්අඩංගුවට ගැනීමට නිලධාරීන් කටයුතු කර ඇතැයිද ඔහු කියයි.

සැකකාර නියාමකවරයා බන්ධනාගාර රෝහලේ රාජකාරි සඳහා යොදවා සිටි බවද ඔහු අනාවරණය කරයි.

සැකකාර නියාමකවරයා සමඟ මත්ද්‍රව්‍ය පල්ලේකැලේ පොලිසිය වෙත භාරදී ඇතැයිද හෙතෙම පෙන්වාදෙයි.

මෙම නියාමකවරයා සම්බන්ධයෙන් ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බවද ඔහු පවසයි.

**නීති විරෝධී දුම්වැටි වෙළඳාම යනු දුම්කොළ කර්මාන්තය විසින් ලොව පුරා පවත්වා ගෙන යනු ලබන ව්‍යාපාරයක් වන අතර දුම්කොළ සමාගම එම නිෂ්පාදන යොදා ගනිමින් නීත්‍යානුකූල සිගරට් මිල අඩු කර ගැනීමට උත්සාහ දරයි.**

ගාල්ල දෙවටේ

2025.01.23

## දියමත ලිස්සායෑම පුහුණු කරන ආයතනයක නීතිවිරෝධී සිගරට් ජාවාරමක්

### රත්ගම STF එකෙන් සිගරට් 29,600ක් හොයාගෙන

ගම්පොළ - දිල්හාන් රාජනායක

ගාල්ල දෙවට ප්‍රදේශයේ දියමත ලිස්සායාම පුහුණු කිරීමේ ආයතනයක් මගින් සංචාරකයන්, ප්‍රදේශයේ වෙළෙඳසල්, පාසල් ළමයින් හා තරුණයන් ඉලක්ක කර කාලයක් තිස්සේ අලෙවි කරමින් තිබූ නීති විරෝධී විවිධ වර්ගයේ සිගරට් තොගයක් ගාල්ල රත්ගම විශේෂ කාර්ය බළකා කඳවුරේ නිලධාරීහු සිය භාරයට ගනිති.

මෙම පුහුණු කිරීමේ මධ්‍යස්ථානය තුළ නීති විරෝධී කටයුතු රැසක්



තොරතුරු රැසක් ලැබී තිබූ අතර විවිධ දුම්වැටි ජාවාරම ඉන් ප්‍රධාන තැනක් ගෙන තිබී ඇත.

විද්‍යුත් සිගරට් ඇතුළු

ළමයින් ඇතුළු තරුණයන් ඉලක්ක කර මොවුන් බෙදා හැර ඇති අතර මෙම නීති විරෝධී සිගරට් වර්ග ඔවුන් හට ඉතා රහසිගත

කඳවුරේ අණදෙන නිලධාරී එස්. විජේසේකරගේ උපදෙස් මත උප පොලිස් පරීක්ෂක පුහසිංහගේ ප්‍රධානත්වයෙන් පොලිස් සැරයන්වරු වන අනුරුද්ධ (72399), පතිරණ (39724), පොලිස් කොස්තාපල්වරු වන වර්ණකුලසූරිය (87658), දිල්ෂාන් (9211), රසික (80907) ඇතුළු නිලධාරී කණ්ඩායමක් මෙම වැටලීම කොට මෙහි තිබූ සිගරට් වර්ග 29,600ක් භාරයට ගෙන ඒ පිළිබඳව වැඩිදුර පරීක්ෂණ සඳහා ඊයේ (22) උදෑසන ගාල්ල වරාය පොලිසිය වෙත

## අලුත් මත් සුරුට්ටුවක් වෙළෙඳපොළේ

2025.01.15

■ බණ්ඩාරගම බිමල් ශ්‍යාමන් ජයසිංහ

**සුරුට්ටුවක් ආකාරයෙන් පානය කර හැකි නවතම මත්ද්‍රව්‍යයක් මේ වනවිටත් සමාජගත වී ඇතැයි උසස් පොලිස් නිලධාරියෙක් පැවසීය.**

මෙම මත්ද්‍රව්‍ය ඉංග්‍රීසි අකුරු මුද්‍රිත කඩදාසි කොළයක් ලෙස නිරීක්ෂණය වන බවත් එම කඩදාසි කොළයෙන් කොටසක් ගෙන කුඩා කැබැලිවලට කඩා සුරුට්ටුවක් සකස් කර දුම්පානය කිරීම මෙහි ඇති විශේෂත්වය බව එම නිලධාරියා කීය.

විදේශීය රසායනික මත්ද්‍රව්‍යයක් වන එය ශරීරයට ඉතා අහිතකර බලපෑම් ඇති කරමින් පුද්ගලයකු මානසික ව්‍යාකූලත්වයට පත්කරන බවට හඳුනාගෙන ඇත.

විශේෂයෙන් තරුණ හා පාසල් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ප්‍රචලිත කිරීමේ අවදියක පවතින මෙම මත්ද්‍රව්‍ය තරුණ හා පාසල් ප්‍රජාව ඉලක්ක කර ගනිමින් ප්‍රචලිත වෙමින් පවතින බැවින් ඒ සම්බන්ධයෙන් සියලුම නිලධාරීන් දැනුවත් කර වැළැක්වීම සඳහා අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගන්නා ලෙස පොලිස්පතිගේ නියෝග අනුව සියලුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, පහළ ශ්‍රේණියේ සියලුම නිලධාරීන් වෙත මේ වනවිටත් අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනුවත් කර ඇතැයිද දැනගන්නට ඇත.

2025.01.10

## 35,000ක් වන වාර්ෂික පිළිකා රෝගීන්ගෙන් 17,000ක් පිරිමි

### පිරිමි පිළිකා රෝගීන්ට ප්‍රධාන හේතුව දුම්පානයයි

● නිදර්ශනී වික්‍රමසිංහ

ශ්‍රී ලංකාව තුළ වසරකට වාර්තා වන 35,000ක් පමණ වන පිළිකා රෝගීන්ගෙන් 17,000ක් පමණ පිරිමින් වන බවත්, ඒ අනුව ඊට ප්‍රධානතම හේතුව දුම්පානය වී ඇති බවත්, පෙණහලු රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමයේ වාර්තා පෙන්වා දෙයි.

ඒ අනුව එම සංගමයේ සභාපති, විශේෂඥ වෛද්‍ය නිරංජන් දිසානායක මහතා ප්‍රකාශ කර සිටියේ, අදාළ පිරිමි පිළිකා රෝගීන්ගෙන් 1,700ක් පමණ පෙණහලු පිළිකාවෙන් පෙළෙන බවයි.

එසේම එම රෝගීන් වයස අවුරුදු 40 - 50ත් අතර පුද්ගලයන් වන බවද ඔහු පෙන්වා දුන්නේය.

පෙණහලු රෝග විශේෂඥ වෛද්‍යවරුන් පෙන්වා දෙන පරිදි පිරිමින්ට වැලඳෙන පිළිකාවලින් බහුතරය මුඛ පිළිකා වන අතර, පෙණහලු පිළිකා දෙවැනි ස්ථානය ගනී. එසේම මෙරට තුළ බෝ නොවන රෝග අතරින් 25%ක් ශ්වසන රෝග වේ.

2025.01.20 - divaina

## රට සිගරැට් හොරෙන් ගෙනා ගෝනවල සහ අධිකාරීගම ගුවන් මගීහු දෙදෙනා අත්අඩංගුවට

කටුනායක ටී.කේ.ජී.කපිල



රුපියල් හතළිස් පන්ලක්ෂ අසූහත් දහසක් පමණ වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක්, නීතිවිරෝධී ලෙස මෙරටට රැගෙනැවිත් කටුනායක ගුවන් තොටුපොළෙන් පිට කරගෙන යමින් සිටි ගුවන් මගීන් දෙදෙනකු ගුවන් තොටුපළ පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් පිරිසක් විසින් ඊයේ (13දා) අලුයම අත්අඩංගුවට ගෙන තිබේ.

මොවුන් අතරින් පළමු ගුවන් මගියා ගෝනවල ගල්ඒදණ්ඩ ප්‍රදේශයේ පදිංචි 29 හැවිරිදි ව්‍යාපාරිකයෙකි.

ඔහු ඊයේ (13දා) අලුයම 12.00ට ඉන්දියාවේ බැංගලෝර් නුවර සිට, ඉන්ඩිගෝ ගුවන් සේවයේ 6 ඊ- 1163 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපළ වෙත පැමිණ තිබුණි. අනෙක් ගුවන් මගියා බලගොල්ල, අධිකාරීගම ප්‍රදේශයේ පදිංචි 27 හැවිරිදි, ඩුබායිහි කම්කරු රැකියාවක නිරත වී සිටි පුද්ගලයෙකි. ඔහු ඊයේ (13දා) අලුයම 03.40 ට ඩුබායි සිට, ෆ්ලයි ඩුබායි ගුවන් සේවයේ 8 ඩී - 828 දරන ගුවන් යානයෙන් කටුනායක ගුවන් තොටුපළ වෙත පැමිණ තිබුණි. ඔවුන් දෙදෙනාගේ ගමන් මලු තුළ 'ප්ලැටිනම්' සහ 'මැන්චෙස්ටර්' වර්ගයේ දුම්වැටි 30,580ක්, සඟවා ගෙන සිටිය දී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන තිබේ. මොවුන් දෙදෙනා එළැඹෙන 15 දා සහ 22 දා යන දිනවල මීගමුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

## ලක්ෂ 23ක විදෙස් දුම්වැටි රේගු දැලේ




● කටුනායක - ටී.කේ.ජී. කපිල

රුපියල් ලක්ෂ විසි තුනක් පමණ වටිනා විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගයක් නීතිවිරෝධී ලෙස ශ්‍රී ලංකාවට රැගෙන ආ ගුවන් මගී කාන්තාවක පෙරේදා (20දා) අලුයම කටුනායක ගුවන්තොටුපොළ පොලිස් මත්ද්‍රව්‍ය ශාඛා අංශයේ නිලධාරීන් පිරිසක් විසින් අත් අඩංගුවට ගෙන තිබේ.

හලාවත, මාරවිල ප්‍රදේශයේ පදිංචි 52 හැවිරිදි කාන්තාවක් මෙසේ අත්අඩංගුවට ගනු ලැබ තිබේ.

සැකකාරිය සතුව තිබූ විදේශීය නිෂ්පාදිත දුම්වැටි 23,000 ක් ඇතුළත් දුම්වැටි කාටූන් 115 ක්ද පොලිස් භාරයට ගෙන ඇත.

එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ගෘහ සේවිකාවක ලෙස සේවයේ නිරතව සිට ඇති ඇය පෙරේදා (20දා) අලුයම අබුඩාබි නුවර සිට කටුනායක ගුවන්තොටුපොළට පැමිණ තිබුණි.

සැකකාරිය හැසිරීම පිළිබඳ සැක සිතූ ආරක්ෂක නිලධාරීන් විසින් ඇය විසින් රැගෙන ආ ගමන් මලු පරීක්ෂා කිරීමේදී ඒවායෙහි සඟවා තිබූ විදේශීය නිෂ්පාදිත දුම්වැටි තොගය සොයා ගනු ලැබ තිබේ.

අත්අඩංගුවට පත් සැකකාරිය ඇපමත මුදාහැර ඇති අතර එළඹෙන 24 වැනිද මීගමුව මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

ගුවන්තොටුපොළ පොලිස් මත්ද්‍රව්‍ය ශාඛා අංශයේ නිලධාරීන් පිරිසක් විසින් මෙම වැටලීම සිදු කර තිබිණ.

# DIGITAL MEDIA

## PROMOTIONS



දෙරණ නාලිකාවේ සති අන්තයේ විකාශය වන සැලෙනා නුවන් ටෙලි නාට්‍ය තුළ මධ්‍යසාර ප්‍රවර්ධනය කරන ආකාරය.







ස්වාධීන රූපවාහිනියේ සති අන්තයේ විකාශය වන **THE RAT** ටෙලිනාට්‍ය තුළ කාන්තාවන්ට සිගරට් පොවන්න ගන්නා උත්සාහය

**2006 අංක 27 දරණ දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත මගින් දුම්කොළ සහ මද්‍යසාර ප්‍රචාරණය තහනම් කර තිබියදීත් රජයේ නාලිකාවල මද්‍යසාර ප්‍රචාරණය කරන ආකාරය සහ කාන්තාවන් මේ සඳහා පොලඹවා ගැනීමට දරන උත්සාහය**

# ජනමාධ්‍යක සමාජ මෙහෙවර නම්!